ආරම්භය : 1945-09-30 ලි.ප. අංකය : කො 39/482
ධර්ම දානය පිණිස සෑම පුර පසලොස්වක් පොහෝ දිනයක් පාසා නිකුත් කරන
දෙහිවල බෞද්ධෝදය සංගමයේ මාසික ධර්ම පත්‍රිකාව

බෞද්ධෝදය

"ධම්මො හවේ රකඛති ධමමචාරි"



70 වර්ෂය - ශ්‍රී. බු.ව. 2559 | 2015 ජූලි 31 | ඇසළ කලාපය

රත්මලාන, ශ්‍රී ධර්මාරාම පුරාණ විහාරවාසී, රාජකීය පණ්ඩිත,
ශාස්ත්‍රපති පූජ්‍යපාද ගෞරව කොටනෙළුවේ පුසද්සදානන්ද හිමිපාණෝ

නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස

# සිදුකළ පවට ඔබ ගියහොත් අපා යට ලක්වනු කෙසේ යම රජුගේ සමා වට

## (දේවදූත සූත්‍රය ඇසුරිනි)

දිනක් අප බුදුරජාණන් වහන්සේ භික්ෂූන් වහන්සේලා ඇමතූ සේක. මහණෙනි, යම් ඇස් ඇති පුරුෂයෙක් තමාදෙසට දොරවල් ඇති ගෙවල් දෙකක් අතර මැද සිටීනම්, ඔහුට එම ගෙවල් දෙකට යන එන අය මෙන් ම ඒ ගෙවල් තුළ එහෙ මෙහෙ ඇවිදින අය ද හොඳින් පෙනේ. එසේ ම බුදුරජාණන් වහන්සෙට අපාය හා දෙව්ලොව යන දෙක ගෙවල් දෙකක් නම් ඒ ගෙවල් දෙකට යන එන සත්ත්වයෝ හොඳින් පෙනේ. අකුසල කර්ම කොට අපායේ යන සත්ත්වයින් හා කුසල් දහම් කොට දෙව්ලොව යන සත්ත්වයින් හොඳින් පෙනේ. එහි හැසිරෙන සත්ත්වයන්ගේ ක්‍රියා කාරකම් හොඳින් දැකගත හැකි වේ.

මිනිස්ලොව දී සත්ත්වයෝ සිතින්, කයින්, වචනයෙන් අකුසල කර්ම කොට මරණින් මතු අපාගාමී වෙති. එවිට යමපල්ලන් දෙදෙනෙක් පැමිණ අත්දෙකින් අල්වාගෙන යම රජු වෙත රැගෙන යයි. එසේ රැගෙන ගොස් ස්වාමිනී. මේ තැනැත්තා/තැනැත්තිය මිනිස්ලොව දී දෙමාපියන්ට සැලකුවේ නැත. වැඩිහිටියන්ට සැලකුවේ නැත. පැවිදි උතුමන්ට සැලකුවේ නැත. බොහෝ පව්කම් කළේ ය. මොහුට දඬුවම් දෙන සේක්වා.! යනුවෙන් පවසයි.

පින්වත්නි, යමරජු එකවර ම දඬුවම් නියම කරන්නේ නැත. ඔහු සමාව දීමට කරුණු විමසා බලයි. එහි දී ඔහුගෙන් ප්‍රශ්න කිහිපයක් අසයි.

01. ඔබ පළමු දේවදූතයා දැක තිබේද? මෙසේ අසන විට හැමකෙනා ම පවසන්නේ ''නැත, ස්වාමීනී,'' යනුවෙනි.

ඔබ මිනිස් ලොව සිටින කල උඩ බලාගෙන කිසිවක් කරකියාගත

නොහැකිව, මල මූත්‍ර කරගනිමින් සිටින කුඩා දරුවන් දැක නැද්ද? ''දැක තිබේ ස්වාමීනී,'' යනුවෙන් ඔහු පිළිතුරු දෙයි.

එසේ නම් නුඹට මේ දරුවා වගේ මමත් ඉපිද මැරෙමින් නැවත ඉපදෙමින් දුක්විඳිනවා නොවේද? කියා නිකමටවත් සිතුනේ නැද්ද? නැත. ස්වාමීනී, එසේ නම් මෙහි වැරැද්ද නුඹගේ අම්මා, තාත්තා, දරුවන්, මිත්‍රයන් හෝ කවුරුවත් සිදු කළා නොව තමා ම කරගන්නා ලද්දකි. කියා දෙවන දේවදූතයා පිළිබඳ විමසයි.

02. ඔබ දෙවන දේවදූතයා දැක තිබේද? මෙසේ අසන විට හැමකෙනා ම පවසන්නේ ''නැත, ස්වාමීනී,'' යනුවෙනි.

ඔබ මිනිස් ලොව සිටින කල වයස අවුරුදු අසූව අනූව වූ කෙස් ඉඳුනු, දත් හැලුණු, ඇඟ රැළි වැටුණ, කුදු ගැහැණු, දිරාගිය සිරුර ඇති ස්ත්‍රී පුරුෂයන් දැක නැද්ද?

'දැක තිබේ ස්වාමීනී,'' යනුවෙන් ඔහු පිළිතුරු දෙයි.

එසේ නම් නුඹට මේ මහල්ලා වගේම මමත් වයසට යනවා නේද? පව්කම් කරන්න හොඳ නැහැ. පින්කම් කළ යුතුයි කියා නිකමටවත් සිතුනේ නැද්ද? නැත ස්වාමීනී, එසේ නම් මෙහි වැරැද්ද නුඹගේ අම්මා, තාත්තා, දරුවන්, මිත්‍රයන් හෝ කවුරුවත් කළා නොව තමා ම කරගන්නා ලද්දකි. කියා තෙවන දේවදූතයා පිළිබඳ විමසයි.

03. ඔබ තෙවන දේවදූතයා දැක තිබේ ද? මෙසේ අසන විට හැමකෙනා ම පවසන්නේ ''නැත. ස්වාමීනී.'' යනුවෙනි.

ඔබ මිනිස් ලොව සිටින කල රෝගවලින් පීඩාවිඳින, රෝග නිසා වද වේදනා විඳිමින් කෙඳිරිගාමින් දුක්විඳින, මලමූත්‍රා කරගෙන අන්‍යයන්ගේ උදව්වෙන් උපකාරයෙන් කටයුතු කරන ස්ත්‍රී පුරුෂයන් දැක නැද්ද?

'දැක තිබේ ස්වාමීනී.'' යනුවෙන් ඔහු පිරිතුරු දෙයි.

එසේ නම් නුඹට මේ රෝගියා සේ ම මමත් රෝගියෙක් විය හැකියි. එනිසා පව්කම් කරන්න හොඳ නැහැ. පින්කම් කළ යුතුයි කියා නිකමටවත් සිතුනේ නැද්ද? නැත ස්වාමීනී, එසේ නම් මෙහි වැරැද්ද නුඹගේ අම්මා, තාත්තා, දරුවන්, මිත්‍රයන් හෝ කවුරුවත් කළානොව තමා ම කරගන්නා ලද්දකි. කියා සිව්වන දේවදූතයා පිළිබඳ විමයසි.

04. ඔබ සිව්වන දේවදූතයා දැක තිබේ ද? මෙසේ අසන විට හැමකෙනා ම පවසන්නේ ''නැත ස්වාමීනී.'' යනුවෙනි.

ඔබ මිනිස් ලොව සිටිය දී රජතුමා දඬුවම් කරනවා දැක නැද්ද? වැරදි කළ සොරුන් අල්වා හුල තියනවා. අත් පා සිඳිනවා. නාසය, කන් ආදිය

සිඳිනවා. හිස සිඳිනවා. මේ ආකාරයට දෙතිස් දඬුවම් දෙනවා දැක නැද්ද? ''දැක තිබේ ස්වාමීනී,'' යනුවෙන් ඔහු පිළිතුරු දෙයි.

එසේ නම් මේ දඬුවම් මටත් කවදා හෝ විඳින්න වේද කියා කියන්න බැහැ. මමත් ඉපිද මැරෙමින් නැවත ඉපදෙමින් යන මේ සංසාරේ මටත් මෙවැනි දේ වෙන්නත් පුළුවන් ඒ නිසා පව්කම් කිරීම හොඳ නැහැ. පින්කම් කළ යුතුයි කියා නිකමටවත් සිතුනේ නැද්ද? ''නැත ස්වාමීනී,'' එසේ නම් මෙහි වැරැද්ද නුඹගේ අම්මා, තාත්තා, දරුවන්, මිත්‍රයන් හෝ කවුරුවත් කළා නොව තමා ම කරගන්නා ලද්දකි, කියා පස්වන දේවදූතයා පිළිබඳ විමසයි.

05. ඔබ පස්වන දේවදූතයා දැක තිබේ ද? මෙසේ අසන විට හැමකෙනා ම පවසන්නේ ''නැත ස්වාමීනී.'' යනුවෙනි.

ඔබ මිනිස් ලොව සිටියන කල මියගිය ස්ත්‍රී පුරුෂයන් දැක නැද්ද? මියගොස් දුගඳ හමන නිල්වන් වූ, විරූපී වූ සිරුරු ඇති පුද්ගලයන් දැක නැද්ද?

''දැක තිබේ ස්වාමීනී,'' යනුවෙන් ඔහු පිළිතුරු දෙයි.

එසේ නම් නුඹට මේ පුද්ගලයා සේ ම මමත් මිය යන්නේය. මාගේ සිරුර ද මෙසේ කුණුවන්නේ ය. දුර්ගන්ධය හමන්නේ ය. එනිසා පව්කම් කරන්න හොඳ නැහැ. පින්කම් කළ යුතුයි කියා නිකමටවත් සිතුනේ නැද්ද? ''නැත ස්වාමීනී,'' එසේ නම් මෙහි වැරැද්ද නුඹගේ අම්මා, තාත්තා, දරුවන්, මිත්‍රයන් හෝ කවුරුවත් කළා නොව තමා ම කරගන්නා ලද්දකැයි කියා යමරජු නිශ්ශබ්ද වෙයි.

පින්වත්නි, ඉක්බිති යමපල්ලන් දෙදෙනා පුද්ගලයා රැගෙන ගොස් ලොකු යකට උල් පහක් ගනී. එකක් දකුණු අතට ද, අනෙක වම් අතට ද තවෙකක් දකුණු පයට ද අනෙක වම් පයට ද ගසයි. ඉතිරි එක පපුව මැදට ගසයි. පුද්ගලයා වේදනාවෙන් කෑ ගසයි. ඉක්බිති තියුණු වෑයක් ගෙන ශරීරය පෙති පෙති වලට රහිනු ලබයි. ඒත් පුද්ගලයා මිය යෑමෙන් කෙළවර වන්නේ නැත. නැවත නැවත උපදී, නැවත නැවත දඬුවම හිමි වේ. ඉන්පසු ලෝදිය හැළියේ ගිල්වීම, මහා ගින්නෙහි දා පිලිස්සීම, නටන උණුවතුරෙහි ගිල්වීම, නපුරු සතුන් ලවා සපාකෑමට සැළැස්වීම ආදී බොහෝ වද බන්ධනවලට ලක්වීමට සිදු වේ.

අපායේ දී දෙන දුක් සමුදාය මෙතෙකැ යි, කියා නිමකළ නොහැකිය. එනිසා පින්වත්නි, ඔබ ජීවත්වන මේ ටික කාලයේ දී කුසල් දහම් සිදුකරගන්න. පස්පවින් වලකින්න. එය සසරගමන කෙටිකරගැනීමට ඔබට හේතුවෙනවා ඇත.

පෙර රාජ්‍ය සමයක ඇමති ධූරයක් දැරූ උපාසක කෙනෙක් අකුසල කර්මයක විපාකයෙන් අපාගත විය. යම පල්ලන් විසින් මොහුව යම රජු වෙත කැඳවා ගෙන යන ලදි. එහිදී යමරජු විසින් දේවදූත පස්දෙනා ගැන ඇසූ විට පිනක් සිහිපත් කර ගැනීමට උපාසක තැන අපොහොසත් විය. එහිදී යම රජ විසින් ඔහු කළ පිංකමක් සිහිපත් කරමින් නුඹට මතකද දිනක් තමා රුවන්වැලි මහා සෑයට සමන් මල් බඳුනක් පූජා කර මටද පින් අනුමෝදන් කලා යයි පිනක් සිහිපත් කළේ ය. පින සිහිපත් වූ විගස ඔහු අපායෙන් නිදහස් වී දෙව්ලොව උපණි. මෙම ප්‍රවෘත්තිය සඳහන් වන්නේ දේවදූත සූත්‍රයේ අට්ඨකථාවක ය.

යම රජුට පින්දීම පිළිබඳ අප සංගමයේ වෙසක් කළාපයක තිබූ විස්තරයක් බොහෝ දෙනා ගේ ඉල්ලීම පරිදි මේ සමග ඉදිරිපත් කරනු ලැබේ.

## යම රජුට පින්දෙන ගාථාව

අධිකරණිකො කම්ම විපාකො - යම රාජෝ ඉද්ධි බලෝ
අනුමෝදිත්වා ඉමං පුඤ්ඤං - නිබ්බානං සුඛ සිද්ධියා